| | |
|---|---|
| | මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 7 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව – I/ II |

නම/ විභාග අංකය: …………………………………… කාලය පැය 2 යි

## I කොටස

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

✶ අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට හිස් තැනට සුදුසු වචනය වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01) පෘථිවි ගෝලයේ මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර මිලියන …………………….. කි. (410 / 510 / 310)

02) 180° දේශාංශය ……………………… (සමකය / ග්‍රිනිච් රේඛාව / ජාත්‍යන්තර දින රේඛාව) නමින් හඳුන්වනු ලබයි.

03) පෘථිවි පෘෂ්ඨයේ ……………………… ක් ජලයෙන් වැසී ඇත. ( 71% / 21% / 29% )

04) ඉතා විශාල, අඛණ්ඩව විහිදෙන බොහෝ විට ජලයෙන් වෙන් වූ භූ ස්කන්ධය …………………………. ලෙස හැඳින්වේ. (සාගරයක් / දූපතක් / මහද්වීපයක්)

05) ලෝකයේ විශාලතම සාගරය …………………………. වේ. (ඉන්දියන් / පැසිෆික් / අත්ලාන්තික්)

✶ ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රනවල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද යොදන්න.

06) ශ්‍රී ලංකාවේ දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා දිග 432km කි. (  )

07) ශ්‍රී ලංකාවේ වෙරළබඩ තැනිතලාව යනුවෙන් හඳුන්වන්නේ 300m ට අඩු භූමි ප්‍රදේශයන්ය. (  )

08) ඊසාන දිග මෝසම් වර්ෂාව මඟින් ශ්‍රී ලංකාවේ බටහිර හා නිරිත ප්‍රදේශවලට අධික වැසි ලැබේ. (  )

09) ආගන්තුක සත්කාරය යනු අස්පෘෂ්‍ය උරුමයකි. (  )

10) ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය 92% කි. (  )

✶ ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.

11) ශ්‍රී ලංකාවේ මුළු භූමියේ වර්ග ප්‍රමාණය ……………………………..$km^2$ වේ.

12) සෑම වෙරළබඩ රාජ්‍යයකටම අයත් නාවික සැතපුම් ……………………………… සීමාව “රාෂ්ට්‍රීය මුහුදු සීමාව” ලෙස හැඳින්වේ.

13) වර්ෂාපතනය, උෂ්ණත්වය හා …………………………. වෙනස්කම් හේතු කොටගෙන ශාකවල ස්වභාවය වෙනස් වේ.

14) පෘථිවි තලය මත ඇති මුළු මහද්වීප සංඛ්‍යාව ……………………….. කි.

15) ලෝකයේ කුඩාම මහද්වීපය ………………………….. මහද්වීපය වේ.

(යුරෝපය / උච්චත්වය / 12 / 65610 / 14 / 7 / ඕස්ට්‍රේලියාව / 64510)

✶ A හා B යා කරන්න.


| A | B |
|---|---|
| 16) ශේෂ කඳු | වියළි කලාපය |
| 17) දිය ඇලි | අභ්‍යන්තර තැනිතලාව |
| 18) හේන් වගාව | යාපනය අර්ධද්වීපය |
| 19) නිදහස් වෙළඳ කලාප | කඳුකර භූ දර්ශනය |
| 20) සාරවත් රතු පස | තෙත් කලාපය |

(ලකුණු 40)

## II කොටස

- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතරින් ප්‍රශ්න 4ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 5කි.

01) (අ) පහත දැක්වෙන ලංකා සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.





i. සංගමන්කන්ද තුඩුව දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන්ද?

ii. නිදහස් වෙළඳ කලාපයක් වන කටුනායක දැක්වෙන අක්ෂරය කුමක්ද?

iii. ශ්‍රී ලංකාවේ අගනගරය පිහිටා ඇති දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක්ද?

iv. ලෝක උරුමයක් වන මහනුවර ප්‍රජා නගරය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(ආ) පහත දැක්වෙන ලෝක ආකෘති සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. කර්කටක නිවර්තනය දැක්වෙන අක්ෂරය කුමක්ද?
ii. මාලදිවයින් දූපත් දැක්වෙන අක්ෂරය වන්නේ කුමක්ද?
iii. C අක්ෂරයෙන් දැක්වෙන රේඛාව කුමක්ද?
iv. පැසිපික් සාගරය දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන්ද?

(ල. 8)

02)

i. පෘථිවි ආදර්ශ ගෝලයේ ඇති අක්ෂරය යනු මොනවාද? (ල. 2)
ii. පෘථිවි භ්‍රමණය හා පරිභ්‍රමණය සඳහා ගත වන කාලය සඳහන් කරන්න. (ල. 4)
iii. පහත රූප සටහනේ දැක්වෙන A, B, C, D, E යන අක්ෂාංශ හා දේශාංශ රේඛා නම් කරන්න.

(ල. 5)




03)

i. ලොව විශාලම මහද්වීපය හා විශාලම සාගරය කුමක්ද? (ල. 2)
ii. ශ්‍රී ලංකාවට අයත් දූපත් 02ක් හා ශ්‍රී ලංකාව අවට පිහිටි දූපත් රාජ්‍යයන් 02ක් සඳහන් කරන්න.

(ල. 4)

iii. ශ්‍රී ලංකාව හැර දකුණු ආසියානු කලාපයට අයත් රටවල් 3ක් නම් කර ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම අනෙක් දකුණු ආසියානු රටවලට වඩා ඉහළින් තැබීමට බලපා ඇති හේතු 02ක් සඳහන් කරන්න.

(ල. 5)

04)

i. 'රාෂ්ට්‍රීය මුහුදු සීමාව' ලෙස හඳුන්වන්නේ කුමක්ද? (ල. 2)
ii. ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විෂමතා කලාප 03 සඳහන් කරන්න. (ල. 3)
iii. ඔබ ඉහත සඳහන් කල භූ විෂමතා කලාප වල දක්නට ලැබෙන භූවිෂමතා ලක්ෂණ 2 බැගින් සඳහන් කරන්න. (ල. 6)

05)

i. ශ්‍රී ලංකාවට වැඩිම වර්ෂාපතනයක් ලැබෙන මෝසම් වර්ෂාවේ ප්‍රධාන කොටස් 2 සඳහන් කරන්න.

(ල. 2)

ii. ශ්‍රී ලංකාවේ වියළි කාලගුණයක් පවතින් මාස 2 මොනවාද? (ල. 4)
iii. ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රම 3 සඳහන් කර ඉන් එක් ක්‍රමයක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ල. 5)

06)

i. ලෝක උරුම බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් 02 සඳහන් කරන්න. (ල. 2)
ii. ජාතික උරුම වර්ග 02 සඳහන් කර ඊට නිදසුනක් බැගින් ලියන්න. (ල. 4)
iii. කඳුකර භූ දර්ශනයේ දක්නට ලැබෙන සානු, දූර්ග හා දියඇළි වලට නිදසුන් 02 බැගින් සඳහන් කරන්න.

(ල. 5)

07)

i. සාපේක්ෂ පිහිටීම යනු කුමක්ද? (ල. 2)
ii. ශ්‍ර ලංකාව හැරුණු විට ඉන්දියන් සාගරය තුළ පිහිටා ඇති දූපත් 2ක් සඳහන් කරන්න. (ල. 4)
iii. ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ පිහිටීම සඳහන් කරන්න. (ල. 5)